මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **LAE/2024/EPS/17** **2024.10.02**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2024.10.26
## ඇල්පිටිය ප්‍රාදේශීය සභාව

### ඡන්දදායකයා විසින් ඡන්ද පෙළේ දී තම අනන්‍යතාව තහවුරු කිරීම

2024.10.26 දින පැවැත්වීමට නියමිත ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමේ දී ඡන්දදායකයන් තමාගේ අනන්‍යතාව තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් අනන්‍යතා ලේඛන පමණක් පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය
3. වලංගු රියදුරු බලපත්‍රය
4. රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත
5. වැඩිහිටි හැඳුනුම්පත
6. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන පූජ්‍ය/ පූජක හැඳුනුම්පත
7. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ජාතික හැඳුනුම්පතේ තොරතුරු තහවුරු කිරීමේ ලිපිය
8. ආබාධ සහිත තැනැත්තන් සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත
9. මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත

02. ඉහත ලියවිලි හැර වෙනත් කිසිම ලියවිල්ලක් එනම් වෙනත් හැඳුනුම්පත්, සහතික කරන ලද ඡායාරූප හෝ ජාතික හැඳුනුම්පත් ඉල්ලුම්පත් භාර ගැනීමේ දී නිකුත් කරන කුවිතාන්සි යනාදි කිසිම ලියවිල්ලක් ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීම සඳහා වලංගු හැඳුනුම්පතක් වශයෙන් ඡන්ද පොළේ දී පිළිගනු නොලැබේ.

03. ඡන්ද පොළේ දී ඡන්ද හිමියාගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා ඉහත 1 – 9 දක්වා වූ හැඳුනුම්පත්වලින් කිසිවක් නොමැති හෝ තිබෙන හැඳුනුම්පත දුර්වර්ණ වීම නිසා අපහැදිලිවීම හෝ පුද්ගලයා හැඳුනුම්පතින් හඳුනාගත නොහැකි නම් එබඳු ඡන්ද හිමියන් මැතිවරණ කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන විශේෂිත හැඳුනුම්පත ලබා ගත යුතුය.

04. මැතිවරණ කොමිෂන් සභාව මගින් නිකුත් කරන විශේෂ හැඳුනුම්පත ලබා ගැනීම සඳහා අයදුම්පත් ලබා ගැනීමේ අවසන් දිනය **2024.10.20** වේ. එබැවින් තාවකාලික හැඳුනුම්පත් ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් නොපමාව හැඳුනුම්පත අවශ්‍ය පුද්ගලයා තමාගේ උඩුකයේ පළල **සෙ.මී. 2 ½, උස සෙ.මී. 3** (1 ¼" x 1") ප්‍රමාණයේ (ජාතික හැඳුනුම්පත ප්‍රමාණයේ කළු/ සුදු හෝ වර්ණ ඡායාරූප පිටපත් දෙකක් ද රැගෙන වසමේ ග්‍රාම නිලධාරී හෝ වත්තේ පදිංචි නම් වත්තේ වතු අධිකාරී හමු විය යුතුය.

05. විශේෂ හැඳුනුම්පත් සඳහා අයදුම්පත් ග්‍රාම නිලධාරී/ වතු අධිකාරී වෙතින් ලබා ගත හැකි අතර, එම අයදුම්පත් සම්පූර්ණ කර ඡායාරූප පිටපත් දෙක ද සමඟ ග්‍රාම නිලධාරී/ වතු අධිකාරී වෙත භාර දිය යුතුය. ඔවුන් විසින් ඡන්ද විමසීම් දිනට පෙර අදාළ අයදුම්කරුවන් වෙත හැඳුනුම්පත් භාර දෙනු ඇත.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්